# ආදර බිංගෝ



ශනුලි ඉමායා රීශින්දි ගුණතුංග

# ආදර බිංගෝ

## 2023

### කතෘ ප්‍රකාශනයකි

ISBN : 978-624-206-892-3

කථාව හා චිත්‍ර - ශනුලි ඉමායා රිශින්දි ගුණතුංග

පාසල - මහාමායා බාලිකා විදුහල - මහනුවර

කතෘගේ වෙනත් කෘති - මලී සහ නදී

2023/12/05

# පිදුම

නිරතුරුවම මා හට

ආදරය කරුණාව ලබා දී

මා හට යහ මග පෙන්වන

මාගේ ආදරණීය

අම්මාටත්, අප්පච්චිටත්

මාගේ පන්ති භාර ගුරුතුමිය වන

චාමිණී පල්ලියගුරු ගුරු මැණියන්ටත්

සෙනෙහසින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි. මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර (විදුහල්පතිනිය)

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023. 10.20

මම පාසල් ගිහින් ඇවිත්

හවස ගෙදර ඉන්නේ

හරිම පාළුවෙන්.

අම්මා වැඩට යනවා.

අප්පච්චිත් වැඩට යනවා.

හවසට

අත්තම්මගේ කතන්දර

අහලත් ඇතිවෙලා


meny
very

දවසක් හවස අප්පච්චි ගෙදර ආවට

පස්සේ මම අප්පච්චිට කිව්වා

මට හවසට ගෙදර ඉන්න පාළුයි කියලා.

ඒක අහලා අප්පච්චිටත් ගොඩක් දුක හිතුනා

කියලා මට තේරුණා

ටික දිනකින් අප්පච්චි හරි සතුටෙන්

මට පෙට්ටියක දාලා තෑග්ගක්

අරගෙන ආවා



ඒ තෑග්ග බලනකල් මට ඉවසිල්ලක්
තිබුණේ නැහැ. මම හරි කලබලෙන්
පෙට්ටිය ඇරලා බැලුවා.

අනේ.....මට හිතාගන්න බැරි වුණා.
ලස්සන බලු පැටියෙක් තමයි
අප්පච්චි මට ගෙනත් තිබුණේ.
එයා හරිම චූටියි. අප්පච්චි කිව්වේ
එයාට වයස මාසයයි කියලා.
එයාගේ ඇස් දෙක පිල් බෝල දෙකක් වාගේ.
කන් දෙක පහලට එල්ලිලා වැටිලා.
ඇඟ දුඹුරු පාට පුළුං ගොඩක් වාගේ.

මම එයාට නමක් දැම්මා බිංගෝ කියලා.
බිංගෝ අපේ ගෙදර ආපු පළවෙනි දවසෙම
මගෙත් එක්ක ගොඩක් යාළු වුණා.





අපේ සීයා බිංගොට ලස්සන කූඩුවක් හැදුවා.
අපි එයා උණුසුම් රෙදි වලින් ඔතලා
රෑ කූඩුවෙන් තිබ්බා. අපි නිදාගෙන
ටික වේලාවකින් පස්සේ බිංගෝ අඬන
සද්දේ අපිට ඇහුණා.

මට හිතුනේ එයාට එයාගේ අම්මා මතක් වෙලා
අඬනවා ඇති කියලා. මට දුක හිතුණා.
මම දුකින් ඉන්න බව අප්පච්චිට තේරුණා.
අප්පච්චි බිංගොව කූඩුවෙන් එළියට අරං
ගේ අතුළට ගෙනාවා. ගෙට ගෙනාවට පස්සේ
ටිකකින් බිංගොඩ හොඳට නින්ද ගියා.
අපි හැමෝම එයාට ගොඩක් ආදරේ කරපු නිසා
ඊට පස්සේ කවදාවත් බිංගෝ එයාගේ අම්මා
මතක් වෙලා ඇඬුවේ නැහැ.
අපිත් එක්ක සතුටෙන් හිටියා.

දවසක් මම පාසල් ඇරිලා ගෙදර යන විට

බිංගෝ ගොඩක් දුකින් හිටියා.

වෙනදා වගේ මගෙ පස්සෙ දැවටි, දැවටි

ඉන්න ආවේ නැහැ. මම බිංගො ගේ

ඔළුව අතගාලා ඇයි ඔයා

දුකින් ඉන්නේ කියලා ඇහුවා.

බිංගෝ බාගෙට ඇස් ඇරලා මගේ දිහා බැලුවා.

බිංගෝ අමාරුවෙන් කෙඳිරි ගානවා මට ඇහුණා.

මම කලබලෙන් දුවලා ගිහිල්ලා අප්පච්චිට

තකා කරලා කිව්වා. ඊට පස්සේ තමා අප්පච්චි

මට කිව්වේ අද බිංගොට බෙහෙත් විද්දා කියලා.

ඒ දවසේ එයා මොකුත් කෑවෙත් නැහැ.

පහුවදා උදෙත් බිංගෝ අමාරුවෙන්

නිදාගෙන හිටියා.

මම පාසල් ගියෙත් ගොඩක් දුකෙන්.



පාසලේදීත් නිතර නිතර මට
බිංගොව මතක් වුණා.
මම පාසල් ඇරිලා ගෙදර යද්දී අනේ
වෙනදා වාගේම ගේට්ටුව අරින සද්දෙට
බිංගෝ කන්දෙකත් උස්සාගෙන සතුටෙන්
දුවගෙන මගෙ ළඟට ආවා.
මට හරිම සතුටුයි.
එදා හවස බෝලෙත් අරගෙන බිංගෝ
මගෙත් එක්ක සෙල්ලම් කරා.

අදටත් මගේ බිංගෝ යාළුවා නිසා
පාසැල් ඇරිලා ගෙදර යන්නේ
ගොඩක් සතුටෙන්.
එයා මගෙත් එක්ක සෙල්ලම් කරන නිසා
මට දැන් කිසිම පාළුවක් නැහැ.

නිමි.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය භික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු!

ISBN : 978-624-206-892-3

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ